# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1043 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 22/06/2024
පැය 0945

**මාධ්‍ය නිවේදනය**

**දිය අනතුරකට ලක් වූ පුද්ගලයෙකු බේරා ගැනීමක් - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය .**

**2024.06.21** වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ බසවක්කුලම වැවෙහි දිය නෑමට ගොස් දියේ ගිලී අනතුරට පත් පුද්ගලයෙකු පොසොන් උත්සවය වෙනුවෙන් ජීවිතාරක්ෂක විශේෂ රාජකාරි යොදවා සිටින අනුරාධපුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ

- පොලිස් පරීක්ෂක හේවගේ
- උප පොලිස් පරීක්ෂක රත්නායක
- පොලිස් සැරයන් 75186 වීරසිංහ
- පොලිස් කොස්තාපල් 90744 නිලංග

යන නිලධාරීන් කණ්ඩායම විසින් බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දීමට කටයුතු කර ඇත .

**දිය අනතුරට පත් පුද්ගලයා වයස අවුරුදු 19 ක් වන දොලුකන්ද, බුස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙවැනි දිය අනතුරු වලින් වැළකීම සඳහා සැමවිටම දියනෑමට සුදුසු ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන වලින් හා පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් රාජකාරී යොදවා ඇති ස්ථාන වල පමණක් දිය නෑම සිදු කරන ලෙසටත්, ඔවුන්ගේ උපදෙස් නිරතුරුව පිළිපැදීමටත් පොලිසිය විසින් මහජනතාව දැනුවත් කරන අතර මෙවැනි අවස්ථාවලදී කුඩා දරුවන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසටත් දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටියි.

මෙයට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත එවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**